**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2010**

**-------------------------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

2.2. **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ග.ප්‍ර.)</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොගවල අගය ගිණුම්වල ගලපා නොතිබුණි. එසේ වුවත්, ශ්‍රී.ල.ගි.ප්‍ර.-5 හි දැක්වෙන නියමයන්ට අනුව, තොග සම්බන්ධව අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) රු.5,732,307 ක් ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස සමුච්චිත අතිරික්තය ගිණුමට ගලපා තිබුණි. එසේ වුවත් මෙම ගැලපීම් ශ්‍රී ලං.ගි.ප්‍ර.-10 සඳහන් නිවැරදි කිරීම් පරිපාටියට අනුව ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර-18 සඳහන් නියමයන්ට අනුව මෝටර් රථයක සම්පූර්ණ පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථයේ පිරිවැය රු.625,000 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා නොතිබුණි.

1.2.2 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කළ අගය මත බදු (වැට්.) පාලන ගිණුමේ හර ශේෂය වු රු.664,418 ක මුදල සාවද්‍ය ලෙස පරිපාලන වියදම් වශයෙන් අදායම් හා වියදම් ගිණුමට ලියාහැර තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල පුහුණු ජාත්‍යන්තර සම්මේලන හා සම්මුති ආයතනයේ (ජා.ස.ස.ආ.) සාමාජික ගාස්තු ගෙවීම් සහ දත්ත පද්ධති කළමනාකරණ ගාස්තු ලෙස දරා තිබුණු රු.1,250,393 ක මුදලක් පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සුනිත්‍ය සංචාරක සංවර්ධන ව්‍යාපෘතියෙහි පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා සහ සේවක දීමනා ලෙස දරා තිබුණු රු.170,960 ක් එම ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කාර්යාංශයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.3 **<u>ගිණුම් වාර්තා පවත්වා ගැනීම</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා පරිගණක ආශ්‍රිත ගිණුම්කරණ පැකේජයක් ඉකුත් වර්ෂය තුළදී මිලටගෙන තිබුණි. එසේ වුවත්, වියදම් වර්ගීකරණය, ලෙජරයට පිටපත් කිරීම්, ගිණුම් සාරාංශ පිළියෙල කිරීම යනාදී මූලික ගිණුම්කරණ කාර්යයන් ඉටුකිරීම සතුටුදායක මට්ටමක නොපැවතුණි.

(ආ) ජර්නල් සටහන් 117 ක් මගින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 18,222,454 ක් විවිධ ගිණුම්වලට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ජර්නල් සටහන් පොතක් පවත්වා නොතිබුණු අතර බොහෝ ජර්නල් සටහන් අසම්පූර්ණව පැවතුණි. ජර්නල් සටහන් පිළියෙල කළ හා අනුමත කළ නිලධාරීන්ගේ කෙටිසන සහ සංලක්ෂය යනාදී මූලික තොරතුරු පවා ජර්නල් සටහන්වල දක්වා නොතිබුණි. එසේම, බොහෝ ජර්නල් වවුචර්වලට උපයෝගී ලියවිලි අමුණා නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජර්නල් සටහන් යෙදීමේ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.2.4 **<u>නොසැසඳූ වෙනස්කම්</u>**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් (ශ්‍රී.ලං.සං.ස.අ) කාර්යාංශයට ලැබිය යුතු සහ ශ්‍රී.ලං.සං.ස.අධිකාරියේ ගිණුම්වලට අනුව රු.17,374,080 ක වෙනසක් ශ්‍රී.ලං.ස.සං.අ. ගිණුම් අතර හා කාර්යාංශයේ ගිණුම් අතර නිරීක්ෂණය විය.

1.2.5 **<u>නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 8 පරිච්ඡේදයේ 8.12 වගන්තිය ප්‍රකාරව, එකතකළ අගය මත බදු ගෙවීම් සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ගිවිසුම්වල පිටපත් කොන්ත්‍රාත්වලට එළඹි මාසයට පසු මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ සහ මු.රෙ. 502 (2) හි සඳහන් නියමයන්ට අනුව, පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) මාසික කාර්යසාධන වාර්තා සහ මෙහෙයුම් ප්‍රකාශන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සේවක වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් සහ මහාභාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීම යනාදී කටයුතු 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සිදුකර නොතිබුණි.

(ඇ) 2011 ජනවාරි 11 දිනැති අංක පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, මාස 6 කට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැලකිල්ලට ගත් පසු 2010 දෙසැම්බර් 31 දිනට පැවති අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි.

1.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

මුළු එකතුව රු.43,081,667 ක් වූ වත්කම්, වගකීම් සහ වියදම් වලින් සමන්විත ගිණුම් විෂයයන් 6 ක් උපයෝගී ලියවිලි ජර්නල්, වවුචර්, විස්තරාත්මක උපලේඛන, සනාථ කිරීම් , භෞතික සත්‍යාපන වාර්තා යනාදිය නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

(අ) ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වලට අනුව, කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවලින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.33,714,232 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ රු.871,534 ක අතිරික්තය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,842,718 ක වර්ධනයක් පෙනනුම් කෙරුණි. සංචාරක සංවර්ධන හා විගමන බදු රු.31,030,780 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වාසදායි හා අදාළවන ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂයේදීද කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලයට ප්‍රමාණාත්මක ගැලපීම් සිදු කර තිබුණි. ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු. 871,534 ක මුදල පෙර වර්ෂයේ ගැලපීම් ලෙස රු.5,732,307 කින් හෙවත් 657% කින් ශ්‍රී.ලං.ගි.ප - 10 ට පටහැනිව

නැවත ගලපා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයටද මෙවැනි ප්‍රමාණාත්මක ගැලපීම් එළඹෙන වර්ෂයේදීද සිදු කළ හැකි බව බැහැර කළ නොහැක.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

2.2.1 **ආර්ථික නොවන ගනුදෙනු**

පුරප්පාඩු වී තිබුණු තනතුරකට බඳවා ගැනීම අත්හිටුවා තිබුණද, මෙම බඳවා ගැනීම සඳහා රු.89,510 ක් වැයකර පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි.

2.2.2 **කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කාර්යාංශය විසින් එහි අලෙවිකරණ හා ප්‍රවර්ධන කාර්යයන් සඳහා පිළිවෙලින් 2009 සහ 2010 වර්ෂ වලදී රු.මිලියන 22.2 ක් සහ රු. මිලියන 16.5 ක් බැගින් වැයකර තිබුණි. කාර්යාංශයේ අරමුණු වලට අනුව, ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය වශයෙන් වූ සම්මේලන , රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව ආකර්ශනීය මධ්‍යස්ථානයක් කර ගැනීම පිණිස මෙක වියදම් දරා තිබුණි. එසේ වුවත්, ප්‍රවර්ධන කාර්යයන්වල සමස්ථ ප්‍රතිඵලය ඇගයීමට ලක්කර නොතිබුණි. සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පැවැත්වීම සඳහා වූ කාර්යයන්ට සෘජු මැදිහත්වීම් අවධාරණයට ලක්කර නොතිබුණි. උදාහරණයක් ලෙස ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ අංග 98 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් සම්මේලන හා රැස්වීම් සියල්ලම වාගේ බාහිර ආයතන විසින් එම ආයතන විසින්ම සැලසුම් කළ කටයුතු වල කොටසක් ලෙස සංවිධානය කර තිබුණි. "ශ්‍රී.ලං.ස. කාර්යාංශය, දේශීය ආයතන, රජයේ නියෝජිතායතන, අධ්‍යාපන ආයතන වලට සම්මේලනාංගයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමට සහායවීම සහ සේවාවන් ප්‍රසිද්ධ කිරීම සඳහා නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමට උපකාර වන බව" කාර්යාංශයෙ සභාපතිවරයා විසින් 2011 ජුනි 06 දින මා වෙත වාර්තා කර තිබුණි.

(ආ) නගම්බු මෙගා නම්වූ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා රු. මිලියන 3.5 ක් වැයකර තිබුණි. මෙම වැඩසටහනේ අරමුණ, කාර්ය සාධනය සහ වියදම්වලට අදාළ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ සංස්කෘතික සම්මේලනාංගයන් පිළිබඳ විදේශීය සංචාරකයන් දැනුවත් කිරීමේ අරමුණින් "ෆල් ශ්‍රී ලංකා" නම්වූ ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 1.6 ක් වැයකර තිබුණි. ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, විදේශීය සංචාරකයින් 892 දෙනෙකු සහ ස්වදේශකයන් 464 දෙනෙකු මේ සඳහා සහභාගී වී තිබුණි. එසේ වුවත් මෙම වැඩසටහන පැවැත්වීම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන තිබුණි.

2.2.3 **මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් සේවකයන් 12 ක් සහ 07 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මානව සම්පත් සඳහා වූ පිරිවැය රු.5,374,697 ක් විය. එක් සේවකයෙකු සඳහා වූ පිරිවැය රු.767,813 ක් විය.

(ආ) කාර්යාංශය මගින් 2007 ජුනි මාසයේ සිට රු. 50,000 ක මාසික වැටුපකට ව්‍යාපෘති කළමනාකරුවෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.සමාලෝචිත වර්ෂය තුළදී මෙම වැටුප රු.57,000 දක්වා වැඩිකර තිබුණි. මෙයට අමතරව, රු. 353,853 ක මුදලක් , ප්‍රවර්ධන දීමනාවක් ලෙසද ඔහුට ගෙවා තිබුණි. එසෙ වවත් මෙම බඳවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම, නිලධාරියාගේ රාජකාරි විස්තර සහ කාර්ය සාධන විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 **සංයුක්ත සැලැස්ම**

2010 සිට 2013 කාලපරිච්ඡේදය සඳහා කාර්යාංශය සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත්, ඇතැම් ප්‍රධාන කටයුතු සංයුක්ත සැලැස්මේ මහ පෙන්වීම් වලින් පරබාහිරව සිදුකර තිබුණි.

2.4 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව උක්නට ලැබුණි.

3. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.

(ඇ) ව්‍යාපෘති කළමනාකරණය.

(ඈ) වත්කම් කළමනාකරණය.